**නෙළුව ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 18 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට නෙළුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සඳහා වූ කර්මාන්ත ණයහිමි ප්‍රතිපාදනය රු.549,674 ක් ද, උසාවි දඩ ආදායම රු.10,000 ක් සහ කඩකුලී දඩ මුදල රු.79,552 ක් ද වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) JCB යන්ත්‍රය සඳහා ලැබිය යුතු රු.200,772 ක කුලී ආදායම සහ පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.853,685 ක දායක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දී රු.7,200,000 කට මිලදී ගෙන ප්‍රාග්ධනිත කර තිබූ ට්‍රක් රථයේ පිරිවැය සමාලෝචිත වර්ෂයේ දී ද ප්‍රාග්ධනිත කර තිබුණි.

#### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 15 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.46,968,339 ක අසමානතා විය.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම

-------------------

ඉදිරියට ගෙනෙමින් පවතින රු.72,839 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත 25 වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු.13,898,048 ක් වූ රජයේ ආධාරද, රු.41,850 ක් වූ බලපත්‍ර ගාස්තුද, රු.232,396 ක් වූ කුලී මුදල්ද, රු.2,500,000 ක් වූ මුද්දර ගාස්තු සහ රු.60,917 ක උසාවි දඩ මුදල් ද, මෙන්ම ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින රු.198,400 ක් වූ සතිපොළ හිඟ එක්වන් මුදල්ද අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ත් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත 20 ක් සඳහා ගෙවීමට තිබූ එකතුව රු.10,842,107 ක් වූ මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

එකතුව රු.70,000 ක් වූ ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් තැන්පතු සහතික ද, එකතුව රු.104,337 ක් වූ හඳුනා නොගත් ආදායම් සම්බන්ධයෙන් ලදුපත් සහ උපලේඛන ද, එකතුව රු.553,683 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු හා වියදම් ණයහිමි ශේෂ සම්බන්ධයෙන් උපලේඛන සහ එකතුව රු.48,465 ක් වූ තොග සම්බන්ධයෙන් තොග ලේඛන සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත විස්තර දැක්වෙන නීති, රීති, සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත | කර්මාන්ත බලපත්‍ර ලබාදීමේ දී අයකර තිබුණු රු.14,000 ක් වූ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් යොමුගත විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ආ) **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

---------------------------

(i) මුදල් රෙගුලාසි 396(ඈ)

බැංකු ජංගම ගිණුම් 02 ක් මඟින් නිකුත් කල නමුත්, ගෙවීමට ඉදිරිපත් නොකල වලංගු කාලය ඉක්මවා තිබුණු රු.46,674 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 1645 හා 1646

සමාලෝචිත වර්ෂය තුළදී වාහන 10 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන්පත් හා මාසික කාර්ය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.226,718 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,616,104 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,389,386 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන් තුළ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම්, පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ෂය | පුනරාවර්තන ආදායම | ආදායම් ආධාර | ස්වයං උත්පාදන ආදායම | පුනරාවර්තන වියදම | සභාවේ ස්වයං උත්පාදන ආදායම ඉක්මවූ වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 23,397,853 | 14,080,858 | 9,316,995 | 23,171,133 | 13,854,138 |
| 2014 | 22,438,984 | 14,253,896 | 8,185,088 | 18,822,879 | 10,637,791 |
| 2013 | 14,238,049 | 7,062,535 | 7,175,514 | 13,624,529 | 6,449,015 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ දෙකෙහි මෙන්ම, සමාලෝචිත වර්ෂයේදී ද ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා පුනරාවර්තන වියදම් වල වැඩිවීමක් පැවතුණි.

(ආ) සභාවට ලැබෙන ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි බව පෙන්නුම් කෙරෙන නමුත්, වියදම් අවම කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**--------------------**

**2.3.1 බදු කුලී**

----------

ඉකුත් වර්ෂය අවසානයට රු.257,924 ක් වූ හිඟ කුලී ආදායම සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.232,395 ක් දක්වා අඩුකර ගෙන තිබුණ ද, කුලීකරුවන් 07 දෙනෙකුගෙන් වසර 03 කටත් අධික කාලයක සිට අයවියයුතු රු.151,603 ක මුදල අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්රයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,500,000 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**3.1.1 වාහන පාලනය**

**----------------**

(i) 1951 අංක 14 දරන මෝටර් රථ ආඥා පනත පරිදි සභාව සතු වාහන 05 ක් සඳහා රක්ෂණාවරණ ලබාගෙන නොතිබුණි.

(ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු වාහන 10 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

(iii) 2014 දෙසැම්බර් 26 දිනැති අංක 08/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සියලුම මෝටර් රථ රක්ෂණ භාර අරමුදල මගින් හෝ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් රක්ෂණය කලයුතු වුවත්, සභාව සතු වාහන 03 ක් පෞද්ගලික රක්ෂණ ආයතනයකින් රක්ෂණාවරණ ලබාගෙන තිබුණි.

### 3.1.2 මානව සම්පත් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ද්විතීයික කාණ්ඩයේ සේවකයින් 06 දෙනෙකු සහ ප්‍රාථමික කාණ්ඩයේ සේවකයින් 08 දෙනෙකුගේ තනතුරුවල පවතින පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ආදේශක හා අනියම් සේවකයින් 09 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතියද, එම තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණවත්ව නොතිබිය දී, වැටුප් ගෙවීම ගැටළුකාරී බව නිරීක්ෂණය විය.

### 3.1.3 සේවක ණය

සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.16,304 ක් වූ ණය මුදල් සඳහා වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණු නමුත්, එම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් ඉටු කරනු ලබන ව්‍යාපෘති 02 ක් සඳහා රු.100,000 ක ප්‍රතිපාදන අනුමත වී තිබූ නමුත්, 2015 දෙසැම්බර් 31 දින වනවිටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ සියලුම කසල, නිවාසවල තිබෙන කසල සහ මල බැහැර කිරීම සඳහා ස්වකීය ප්‍රදේශය ඇතුළත හැකිතාක් දුරට අවශ්‍ය සියලු පියවර ගැනීම සභාවේ කාර්යයක් වියයුතු වුවත්, සභාව විසින් එම කටයුතු සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක රු.500,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන් 04 ක එකතුව රු.2,466,613 ක ඉතිරිවීම්ද, තවත් වියදම් විෂයයන් 04 ක සීමාව ඉක්මවා එකතුව රු.34,818,715 ක වියදම්ද, ආදායම් විෂයයන් 06 ක ලඟාකර නොගත් ඉලක්කගත ආදායම් එකතුව රු.7,111,882 ක් ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

**------------------------**

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය පරිදි අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගෙන නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

පිරිවැය රු.25,000 ක් වූ පුද්ගල ඔසවන යන්ත්‍රය 2014 නොවැම්බර් 26 දින සිට භාවිතයෙන් ඉවත් කර සභා භූමියේ අනාරක්ෂිතව ගාල් කර තිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම්**

--------------------------

සභාව විසින් භාවිතයට යොදවා ගෙන ඇති වාහන 10 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය